ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර අවසාන පරීක්ෂණය -2007

**ESC 1137/1126 -** පරිසර ගවේශනය හා ඉගැන්වීමේ සමෝධානිත ප්‍රවේශය

කාලය - පැය 02 යි.

---

දිනය - 2007.06.10 වේලාව - පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00 දක්වා

---

එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

01. (අ) පෙර පාසල් ළමයින්ගේ පහත දැක්වෙන ගති ලක්ෂණ ඔවුනට පරිසරය ගවේෂණය කිරීම සඳහා උපකාරී වන්නේ කෙසේදැයි උදාහරණ සහිතව පැහැදිළි කරන්න.

(i) කුතුහලය
(ii) සචලතාවය

(ලකුණු 10)

(ආ) "වැසි ජලය" "පස" හා "පාෂාණ" යන තේමා තුළින් පෙර පාසල් ළමයෙකුහට තම පරිසරය ආශ්‍රිතව ලබා ගත හැකි ඉගෙනුම් අත්දැකීම් පරීක්ෂා කරන්න.

(ලකුණු 15)

02. (අ) සතුන් පිළිබඳව ඉගෙනුම් අත්දැකීම් ලබා දීම සඳහා පෙර පාසල් ළමයින් සහභාගී කර ගනිමින් සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් කෙටියෙන් දක්වන්න.

(ලකුණු 05)

(ආ) ඔබ ඉහත දැක්වූ ක්‍රියාකාරකම් දෙක සඳහා පෙර පාසල් ළමයින් සහභාගි කර ගන්නා ආකාරය පහත දැක්වෙන මාතෘකා යටතේ පැහැදිළි කරන්න.

i. අරමුණු
ii. ප්‍රවේශය (ක්‍රියාකාරකම් ඔබ ආරම්භ කරන්නේ කෙසේ ද?)
iii. ප්‍රශ්ණ සහ අපේක්ෂිත පිළිතුරු
iv. අවසානය ( ඔබ ක්‍රියාකාරකම් අවසන් කරන්නේ කෙසේ ද?)

(ලකුණු 20)

03. (අ) පෙර පාසල් ළමයින්ට පරිසරය ගවේශණය කිරීමට සහය වන පරිදි පෙර පාසල් වත්ත සකස් කිරීමේදී සැලකිල්ලට ගත යුතු ප්‍රධාන අංශ දක්වන්න.

(ලකුණු 05)

(ආ) පෙර පාසල් ළමයින්හට පරිසරය ගවේශණය කොට ඉගෙනීම සඳහා මෙම එක් එක් අංශයේ වැදගත්කම විස්තර කරන්න.

(ලකුණු 20)

04\. (අ) සමෝධානිත ප්‍රවේශය යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.
(ලකුණු 10)

(ආ) සම්ප්‍රදායික විෂයානුබද්ධ ඉගැන්වීමේ ක්‍රමය හා විෂය සමෝධානිත ඉගැන්වීමේ ක්‍රමය අතර වෙනස විස්තර කරන්න.
(ලකුණු 15)

05\. අපට සහය වන්නන් අතරින් ඕනෑම චරිතයක් තෝරා ගන්න.

මෙම චරිතය තේමාව ලෙස යොදා ගනිමින්, සමෝධානිත, ප්‍රවේශය භාවිත කරමින් ඔබගේ පෙර පාසලේ ක්‍රියාකාරකම් සැලසුම් කරන ආකාරය රූප සටහන් සහිතව පැහැදිලි කරන්න.
(ලකුණු 25)

06\. (අ) ක්‍රියාකාරකමක් අවසන් වූ පසු පෙර පාසල් ළමයින්ගේ සංවර්ධනය තක්සේරු කිරීමේදී ඔබගේ අවධානය යොමු විය යුතු ළමා සංවර්ධනයේ අංශ මොනවාදැයි දක්වන්න.
(ලකුණු 10)

(ආ) ඔබගේ පෙර පාසලේ සතියක වැඩ සටහනකට තේමාව ලෙස "වැස්ස" ඔබ විසින් තෝරා ගනු ලැබ ඇත. මෙම වැඩ සටහන සඳහා ඔබ විසින් සමෝධානිත ප්‍රවේශය අනුගමනය කරන ලදී.

මෙම වැඩ සටහන අවසානයේ ළමයින්ගේ ප්‍රගතිය ඔබ තක්සේරු කළ ආකාරය පහත දැක්වෙන මාතෘකා යටතේ නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

- භාෂාව
- සෞන්දර්ය අගය කිරීම
- පරිසරය පිළිබඳ උගත් කරුණු

(ලකුණු 15)

\- හිමිකම් ඇවිරිණි. -